# කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

## දුරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය

### ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධි දෙවන පරීක්ෂණය (බාහිර) - 2022
### 2024 දෙසැම්බර් / 2025 ජනවාරි

### සමාජීය විද්‍යා පීඨය

### භූගෝල විද්‍යාව
### (නව නිර්දේශය)

### සිතියම් විද්‍යාව හා භූගෝලීය තොරතුරු පද්ධති - GEOG 28224

ඕනෑම ප්‍රශ්න පහකට (05) පිළිතුරු සපයන්න.

**ප්‍රශ්න සංඛ්‍යාව : 08 යි.** **කාලය : පැය 03 යි.**

---

01. කිසියම් ව්‍යාපෘතියක් සැලසුම් කිරීමේදී සිතියම භාවිත කළහැකි ආකාර උචිත නිදසුන් 04ක් ඇසුරින් පැහැදිලි කරන්න. (ලකුණු 20)

02. "සිතියම් විද්‍යාඥයෙකු 40% ක් භූගෝල විද්‍යාඥයෙක් බවත්, 20% ක් චිත්‍ර ශිල්පියෙක් බවත්, 20% ක් කාර්මික ශිල්පියෙක් බවත්, 10% ක් ගණිතඥයෙකු සහ 10% ක් සියලු විෂයන් පිළිබඳ උගතෙකු වන බව" අර්වින් රේස් විසින් දැක්වූ මෙම ප්‍රකාශය කොතෙක් දුරට පිළිගත හැකිවන්නේදැයි සාකච්ඡා කරන්න. (ලකුණු 20)

03. සිතියම් අංක 01 තුළින් ලබා දී ඇති 1:50,000 පරිමාණ භූ ලක්ෂණ සිතියම් කොටස පදනම් කරගෙන පහත සඳහන් ක්ෂේත්‍ර ආවරණය වන සේ විවරණය කරන්න.

    අ) භූ විෂමතාව සහ භූමි පරිභෝගය

    ආ) ජලවහනය සහ කෘෂිකාර්මික කටයුතු

    ඇ) භූ විෂමතාව සහ මාර්ග ජාලයෙහි ව්‍යාප්තිය

    ඈ) ජනාවාස සහ මාර්ග ජාලයෙහි ව්‍යාප්තිය (ලකුණු 20)

04. අ) භූගෝලීය තොරතුරු පද්ධති හඳුන්වන්න. (ලකුණු 05)

    ආ) සාම්ප්‍රදායික සිතියම් හා නවීන සිතියම් අතර පවතින වෙනස්කම් පහක් (05) පැහැදිලි කරන්න. (ලකුණු 15)

05. අ) ගුවන් ඡායාරූප හඳුන්වන්න. (ලකුණු 04)

    ආ) ගුවන් ඡායාරූප හා භූ ලක්ෂණ සිතියම් අතරැති වෙනස්කම් තුනක් (03) පැහැදිලි කරන්න. (ලකුණු 06)

    ඇ) ගුවන් ඡායාරූපයක පිටත සීමාවෙහි අන්තර්ගත ලක්ෂණ පහක් (05) නම් කර ඒවා ගුවන් ඡායාරූප අධ්‍යයනයේ දී වැදගත් වන ආකාරය පහදන්න. (ලකුණු 10)

06. අ) සිතියම් ප්‍රක්ෂේපණ හඳුන්වන්න. (ලකුණු 05)

ආ) ධ්‍රැවාශ්‍රිත කලාපයෙහි අයිස් ව්‍යාප්තිය සිතියම් ගතකිරීම සඳහා වඩාත් උචිත එක් ප්‍රක්ෂේපණයක් නම් කර, එය නිර්මාණය කරන ආකාරය දළ රූප සටහන් සහිතව විස්තර කරන්න. (ලකුණු 15)

07. අ) 'භූගෝලීය තොරතුරු පද්ධති භාවිත කිරීමේ දී දත්ත සඳහා සුවිශේෂී ස්ථානයක් හිමි වේ.' විමසන්න. (ලකුණු 10)

ආ) 'දුරස්ථ සංවේදන' (Remote Sensing) තාක්ෂණය යනුවෙන් කුමක් අදහස් වේදැයි දක්වා එය සිතියම් නිර්මාණයේ දී වැදගත් වන ආකාරය පැහැදිලි කරන්න. (ලකුණු 10)

08. මතු සඳහන් මාතෘකා දෙකක් (02) තෝරාගෙන ඒවාට කෙටි සටහන් ලියන්න.

අ) තේමා සිතියම්

ආ) ආරෝපිත පැතිකඩ

ඇ) බෑවුම් විශ්ලේෂණය

ඈ) ගෝලීය ස්ථානගත කිරීමේ පද්ධති (GPS) (ලකුණු 2x10=20)

*******************************

ඇමිණුම අංක 01

## මතුගම භූ ලක්ෂණ සිතියමෙන් කොටසකි




පරිමාණය 1 : 50000

12/11/2024